**1979 අංක 23 දරණ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ පරිදි 24 (1) වගන්තිය යටතේ දැන්වීමයි**

මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කරන ඉඩම හෝ ප්‍රදේශය, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ, ක්‍රියාත්මක වන මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා යොදා ගැනීමට නියමිතය. අංක 41 හා 1979.06.15 දිනැති ගැසට්පත්‍රය, මගින් මහවැලි විශේෂ බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශිත පහත උපලේඛනයට ඇතුළත් කොට විස්තර කරනු ලබන, ඉඩම හෝ ප්‍රදේශය, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය බල ප්‍රදේශය ඇතුළත පිහිටියාවූද, තවදුරටත් එකී ප්‍රදේශය තුල පෞද්ගලික අයිතිය සනාථ කල හැකි ඉඩමක් වේනම්, ඔවුන් වෙත එකී අයිතිවාසිකම් හෝ වෙනයම් සම්බන්ධකමක් කියාපෑම සඳහා, මෙම පනතේ (1979 අංක 23 දරණ ශ්‍රී ලංකා මහවැලි අධිකාරි පනතේ) 24 (1) වගන්තියේ පවතින විධි විධාන ප්‍රකාරව, ලිඛිතව හිමිකම් ඉදිරිපත් කිරීමටත්, එකී හිමිකම් නිසි විමර්ශනයක් යටතේ පරීක්ෂා කර බැලීම සඳහා හිමිකම් පරීක්ෂණයක් පැවැත්වීමටත්, කටයුතු සලස්වා ඇති බැව් මෙයින් දැනුම් දී සිටිමි.

**උපලේඛනය**

| | | |
|---|---|---|
| දිස්ත්‍රික්කය | :- | මඩකලපුව හා අම්පාර |
| ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය | :- | මහඔය, එරාවූර් පත්තු, කෝරලෙයි පත්තු - දකුණ |
| ග්‍රාමසේවා නිලධාරී කොට්ඨාසය | :- | 144 B/1 බෝගමුයාය (කොටසක්), 201 A ඊරලකුලම් (කොටසක්), 209 D කුටුම්බිමලෙයි (කොටසක්) |
| ගමේ නම | | මාදුරුඔය දකුණු ඉවුර ඒකක 01 |
| ඉඩමේ නම | :- | මාදුරුඔය දකුණු ඉවුර ඒකක 01 |
| පිඹුරු අංකය | :- | භූගෝලීය 1:50000 සිතියම් අංක 44 කොටසක් (අරලගංවිල) |
| ප්‍රමාණය | :- | හෙක්ටයාර 2511 |
| හිමිකම ඉදිරිපත් කලයුතු අවසන් දිනය | :- | 2026 අගෝස්තු 15 |
| එම හිමිකම් ලිඛිතව ලියාපදිංචි තැපැලෙන් හෝ පැමිණ භාරදිය හැකි ස්ථානය | :- | නේවාසික ව්‍යාපාර කළමනාකාර කාර්යාලය, බී කලාපය, වැලිකන්ද. |

තවදුරටත් ඉහත කී දැන්වීම අදාළ වන ප්‍රදේශය, හඳුනාගැනීමේ පහසුව සඳහා GPS ඛණ්ඩාංක හා ප්‍රදේශය දැක්වෙන සිතියම www.mahaweli.gov.lk යන ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නිල වෙබ් අඩවියෙන් බාගත කරගත හැකි අතර, එහි දෘඩ පිටපතක් නේවාසික ව්‍යාපාර කළමනාකාර කාර්යාලයෙන් ලබාගත හැක.

ඉහත දැක්වෙන උප ලේඛනයේ දැක්වෙන ප්‍රදේශයතුල පිහිටි ඉඩමක් හෝ ඉඩම් කොටසක් සඳහා, වලංගු සින්නක්කර ඔප්පු, දීමනාපත්‍ර, ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කල බලපත්‍ර හෝ වෙනයම් වලංගු ඔප්පුවක් යටතේ, නිරවුල් අයිතියක් හෝ භුක්තියක් හෝ හිමිකමක් ඇත්තේනම්, ඒ බැව් 2026 අගෝස්තු 15 දිනට ප්‍රථමව, ලියාපදිංචි තැපැලෙන් ලිඛිතව හෝ නේවාසික ව්‍යාපාර කළමනාකාර, නේවාසික ව්‍යාපාර කළමනාකාර කාර්යාලය, බී කලාපය, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, වැලිකන්ද, කාර්යාලයට පැමිණ, ලිඛිතව ඉදිරිපත් කල යුතුය. තවද ඔබ හිමිකම් කියන ඉඩම සඳහා හිමිකම තහවුරු කිරීමට අදාලවන සියලුම ලේඛන වල (ඔප්පුවේ හෝ බලපත්‍රයේ සහතික පිටපතක්, පත්ඉරු ඇත්නම් එම ලේඛනවල සහතික පිටපත්, ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ සහතික ඇත්නම් එහි පිටපත්, ඉඩමට සබැදි සැළසුම් හෝ පිඹුරුපත් ඇත්නම් එහි පිටපතක්) සහතික කල පිටපත් සමඟ එම ලිඛිත ඉල්ලීම භාරදිය යුතුය.

<u>මෙසේ හිමිකම ඉදිරිපත් කරන ඔබ වෙත, ලිපියක් යොමු කිරීමට අවශ්‍ය වුවහොත්, ඊ සඳහා අදාල වන නිවැරදි ලිපිනය සහ ඔබගේ ක්‍රියාකාරී දුරකතන අංකය හා මෙවනවිට ස්ථිර පදිංචිය දරණ ග්‍රාම නිලධාරී වසම ඇතුළත් ග්‍රාම නිළධාරී වාර්තාවක්ද ලබාදිය යුතුය. (පදිංචි සහතිකය)</u>

තවද, 2026 සැප්තැම්බර් 01 දින සිට ආරම්භකර මසක් ඇතුළත එකී ඉඩම සඳහා හිමිකම පරීක්ෂණ පවත්වා නිම කිරීමට බලාපොරොත්තුවේ. එබැවින් ඉහත දක්වා ඇති දිනට ප්‍රථම හිමිකම කිම සඳහා අවැසි ලේඛන ඉදිරිපත් කලයුතුවේ.

1979 අංක 23 දරණ ශ්‍රී ලංකා මහවැලි අධිකාරි පනතේ 24 (1) වගන්තියේ පවතින විධි විධාන ප්‍රකාරව, මෙකී පරීක්ෂණ පැවැත්වීමට, ලේඛන කැඳවීමට, ඊ සඳහා අවැසි අවස්ථාවල සෙසු සබැඳි ආයතන හා සම්බන්ධ වෙමින් කමිටු පිහිටුවා ක්‍රියා කිරීමට, මහවැලි බී කලාපයේ නේවාසික ව්‍යාපාර කළමනාකාර වෙත බලය ඇත්තේය.

එච්.එම්.ජේ.කේ. හේරත්,
අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

2026/07/01 වැනි දින,

අංක 500, ටි.බි. ජයා මාවත, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ප්‍රධාන කාර්යාලයේදිය.